www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක වෙළඳ සාකච්ඡා බිඳවැටේ

**Global trade talks collapse**

**බිල් වැන් ඕකන් විසිනි**

**2008 ජුලි 31**

ජිනීවාහි පැවති සාකච්ඡා තිත්ත කටුකභාවයෙන් සහ අන්‍යෝන්‍ය චෝදනා කරගැනීමෙන් බිඳවැටීම නිසා ලෝක නිදහස් වෙළඳ ගිවිසුමක් ගැන අපේක්ෂා මේ සතියේදී සුන් වී ගියේය.

දින නවයක් පුරාවට පැවති ඉහල තලයේ සාකච්ඡා වටයෙන් පසු වෙළඳ ඇමතිවරු හිස් අතින් නික්ම ගියහ. බාධා රහිත විවෘත වෙළඳපොලක් ඉල්ලූ බටහිර අධිරාජ්‍යවාදී බලවේග සහ විශේෂිතවම, එ.ජ. කෘෂිව්‍යාපාර මගින් නිෂ්පාදිත ලාබ අපනයන ප්‍රවාහයෙන් තම කෘෂිකාර්මික අංශ බේරා ගැනීම සඳහා විධි ක්‍රම පවත්වාගෙනයාමට ඉන්දියාවේ හා චීනයේ " නැගීඑන" ආර්ථිකයන්ගේ පවතින වුවමනාව අතර හිඩස පිරවීමට ඔවුනට නොහැකිවිය.

"වහෙන් ඔරෝ කියන එකේ තේරුමක් නැහැ. රැස්වීම බිඳ වැටුනා. සාමාජිකයන්ට තම තමන්ගේ වෙනස්කම් සමනය කරගන්නට නොහැකි වුනා." ලෝක වෙළඳ සම්මේලනයේ අධ්‍යක්ෂ ජනරාල් පැස්කල් ලැමී මාධ්‍යයට පැවසීය.

පසුගිය වසර 7 පුරාවටම එවැනි සාකච්ඡා බිඳවැටීම නිත්‍ය සිදුවීමක් විය. 2003 කැන්කුන්හිදී සහ වසර 2 කට පසුව හොංකොංහිදී පැවති ඇමතිවරුන්ගේ රැස්වීම් හා සමානවම 2006 ජිනීවාහිදී සහ ගිය වසරේ ජර්මනියේ පොට්ස්ඩෑම්හිදී පැවති අනෙකුත් සාකච්ඡා වටද ගනුදෙනුවකට එලඹීමට අසමත් විය.

ලෝක වෙළඳ සම්මුතියකට සාකච්ඡා ආරම්භ කෙරුනු 2001 වසරේ කටාර් අගනුවරදී පැවති, එබැවින්ම ඊනියා ඩෝහා වටය ලෙස නම්කෙරුනු, මුල් සමුලුවේ පෙරමුනගත් සහභාගී වූවෝ, කෙසේ වුවද, ඊලග අවුරුදු කීපය තුල හෝ කෙදිනක හෝ සාකච්ඡා නැවත පනගැන්විය හැකිදැයි මෙහිදී ප්‍රශ්න කලහ.

ආනයන ඉහලයන අවස්ථාවකදී කෘෂිකාර්මික භාන්ඩ මත තාවකාලිකව බදු වැඩිකරන්නට අවසර දෙන ඊනියා "විශේෂිත ආරක්ෂිත යාන්ත්‍රනය" සම්බන්ධව ඇති වූ මතභේදයක් සාකච්ඡා සිරකල කාරනාව විය. එවැනි ප්‍රතිපාදනයක් ක්‍රියාත්මක කෙරෙන්නේ කුමන ප්‍රමානයකට ආනයන ඉහල යාමේදීද යන්න එම කාරනාව විය ආනයන සියයට 10 ක වැඩිවීමකදී එය සිදුකල යුතුයැයි ඉන්දියාව සහ චීනය යෝජනා කරද්දී, සියයට 40 වැඩිකරන අවස්ථාවකදී පමනක් එයට ඉඩ සැලසිය යුතුයැයි වොෂින්ටනය අවධාරනය කලේය.

එය ස්ථායී දේශීය ආහාර සැපයීම් සුරක්ෂිත කිරීමේ කාරනාවක් ලෙස දැක්වූ බීජිං සහ නවදිල්ලිය එම කරුන ගැන තමන් දේශපාලනිකව මදක් හෝ ලිහිල් වීමට ඇති හැකියාව බැහැර කලේය. "සෑම රටක්ම තමන්ගේ ආහාර ආරක්ෂාව සුරක්ෂිත කල යුතුයැ"යි ඉන්දීය වානිජ සහ කර්මාන්ත ඇමති මෙන්ම රටෙහි ප්‍රධාන වෙළඳ සාකච්ඡාකරුවන කමල් නාත් පැවසීය. "සංවර්ධිත රටවල වානිජමය අරමුනුවලට එරෙහිව දුගී ගොවීන්ගේ අනාරක්ෂිතබව ගනුදෙනු කල නොහැකිය." ඔහු තවදුරටත් අවධාරනය කලේය.

චීන සහ ඉන්දියානු පාලක දෙගොල්ලන්ම ග්‍රාමීය ජනගහනයේ වැඩෙන නොඉවසිලිවන්තභාවයට මුහුන දී සිටිති. චීනයේ ප්‍රාදේශීයව මිලියන 500ක් පමන ජීවත්වන අතර ඉන්දියාවේ මිලියන 700 ක් පමන කෘෂිකර්මාන්තය මත යැපෙති. ලාභ විදේශීය ආනයන මගින් ඇති කෙරෙන තරගකාරිත්වය නිසා විශාල සංඛ්‍යාවක් දුගී ගොවීන් තම භූමියෙන් පලවා හැරීමට ලක්වීමට පවතින ඉඩකඩ රටවල් දෙකෙහිම සමාජ කැලඹීමක තර්ජනයක් පෙන්නුම් කරයි.

ලබන වසරේදී කොන්ග්‍රස් පක්ෂය නායකත්වය සපයන රජය මැතිවරනයකට මුහුන දෙන බැවින්, ජනගහනයෙන් දැවැන්ත බහුතරයක් වන ග්‍රාමීය දුගීන් බලවත් කෝපයකට ලක්කෙරෙන ගනුදෙනුවකට එලඹීමට ඉන්දියානු සාකච්ඡාකරුවන්ට අවශ්‍යතාවයක් තිබුනේ නැත.

සාකච්ඡා බිඳවැටෙන්නට පෙරාතුව, බීජිං ආන්ඩුවේ නිල පුවත්පත වන චයිනා ඩේලි හි බදාදා පල වූ කතුවැකියෙන් සාකච්ඡාවට බඳුන්වෙමින් පැවති සම්මුති කෙටුම්පත විවේචනයට ලක්කෙරුනි. "මෙම

යෝජනාව, පොහොසත් රටවලින් එන ලාභ ගොවිපල ආනයනයන් නිසා, සංවර්ධනය වන රටවල අනාරක්ෂිත ගොවීන්ගේ ජීවිත අනතුරේ හෙලන බව" එය ප්‍රකාශ කලේය.

චීන පුවත් ඒජන්සිය වන ෂින්හුවා ද එ.ජ. ස්ථාවරයට පහර දුනි. "මෙම ආත්මාර්ථකාමී සහ අදූරදර්ශී හැසිරීම පහල මට්ටමේ ලෝ.වෙ.ස. වෙලඳ ඇමතිවරුන්ගේ රැස්වීම කඩාකප්පල්වීමට පැහැදිලිවම හේතුවුන අතර එය තදබල ප්‍රතිවිපාක මාලාවක් දක්වා රැගෙන යනු ඇත."

ඊනියා සංවර්ධනය වන රටවල්වල වෙලඳපොල විවෘත කලහොත් ඒ වෙනුවට එ.ජ. සහ යුරෝපීය සංගමය (යු.ස.) යන දෙගොල්ලන්ම කෘෂිකාර්මික සහනාධාර කපාහරින්නට යෝජනා කලද මෙය සොච්චම් සහනයක් බව පුලුල්ව පෙනී ගියේය.

"සංවර්ධිත රටවල් පැත්තෙන් වානිජමය කරුනු මත සහන සැලසීමට අඩු කැමැත්තක් තිබෙන නමුත් ඔවුන් සඳහා වාසි ලබා ගැනීමට වැඩි උද්යෝගයක් පෙන්නුම් කරනවා" ආර්ජෙන්ටිනාවේ විදේශ ඇමති ජෝර්ජ් ටයියානා සඳහන් කලේය.

එලෙසම ඉන්දුනීසියානු වෙලඳ ඇමතිනි මේරි එල්කා පන්ගෙස්තු වොෂින්ටනයේ දෘඪ අත්තනෝමතික බාවය සහ වැඩෙන ආර්ථික බලවේග වන චීනය, ඉන්දියාව, සහ බ්‍රසීලය ට උපකාර කිරීමට එ.ජ. හා යු.ස. යේ ප්‍රතික්ෂේප කිරීම සාකච්ඡා බිඳවැටීමට හේතු වූ බවට දොස් නැගුවාය. දේශීය කෘෂිකර්මාන්තය ආරක්ෂා කිරීමේ වැඩපිලිවෙලක් සඳහා ඉන්දීය, චීන, සහ අනෙකුත් රටවල ඉල්ලීම "සාධාරන ඉල්ලීමක්" වන නමුත් එ.ජ. "නම්‍යතාවයක් පෙන්නුම් නොකිරීමට වගබලාගන්නට" අධිෂ්ඨාන කරගෙන ඇති බව ඇය පැවසුවාය.

මෙම විවේචනයට ප්‍රති උත්තර සපයමින්. එ.ජ. වෙලඳ නියෝජිතවරිය වන සුසාන් ෂ්වැබ් යෝජිත ආරක්ෂාව "තදබලු ආරක්ෂනවාදයේ උපකරනයක්" ලෙසට හෙලා දුටුවාය. "භූගෝලීය වෙලඳ ක්‍රමය එක් වසරකින්, හෝ වසර 5 කින් නොව, වසර 30 කින් ආපසු හරවන ප්‍රතිපලයක් සමග එලියට බැසීම කෙසේවත් කල නොහැකි" යැයි ඇය පැවසුවාය.

භූගෝලීය ආහාර අර්බුදය පවතින තතු තුල "ආහාර ආනයනයට රටවලට තම බාධක කොතරම් ඉහල නැංවිය හැකිදැයි යන්න මින් තහවුරු වීම" "කිසිසේත් පිලිගත නොහැකියැ"යි ෂ්වැබ් කියා සිටියාය.

ඩෝහා සාකච්ඡා වටයෙන් පසු ගතවූ හත් වසර තුලදී සම්මුතියකට එලඹීමට අසමත් වුන අවස්ථා හතරේදීම භූගෝලීය වෙලඳාමේ යාන්තම් සියයට 7 ක් පමනක් වන කෘෂිකර්මාන්තය සාකච්ඡා ඇනහිටින බාධකය බවට ඔප්පු වී ඇත.

එක් අතකට බලවත් කෘෂිකාර්මික ආයතන විසින් ඊර්ෂ්‍යාසහගතව ආරක්ෂා කෙරෙන රාජ්‍ය සහනාධාර ක්‍රමය ඉවත දමන්නට එ.ජ. සහ යු.ස. අකමැති වී ඇත. අනෙක් අතට නිදහස් වෙලඳ සම්මුති සහ විදේශ ආනයන ගැලීම් විසින් දේශීය කෘෂිකාර්මික නිෂ්පාදකයින් අතුගා දැමීම දිස්වෙද්දී ඊනියා සංවර්ධනය වන රටවල ආන්ඩු ආරක්ෂනවාදී වැඩපිලිවෙලවල් ඉවතලන්නට අකමැතිය.

මිලියන දහස් ගනනක ජනතාවක් බඩගින්නේ තබන්නට තර්ජනය කෙරෙන මෑතකාලීන භූගෝලීය භාන්ඩ මිල ඉහලයාම මගින් මේ කාරනාව සම්බන්ධ ආතතීන් තද බල ලෙස උග්‍ර කෙරී ඇත. භූගෝලීය කෘෂිව්‍යාපාරික සමාගම් වැඩි ලාභ උපයා ගැනීමට ඇති විභවය දකින අතරේදී ඉන්දීය චීන සහ අනෙකුත් රටවල ආන්ඩු හාල් සහ අනෙකුත් මූලික ආහාර වල ඉහල යන මිල ගනන් විසින් නිර්මානය කෙරෙන අවිනිශ්චිත තත්වය සමනය කරන්නට ඇති හැකියාව නැතිවීම ගැන බියවී සිටිති.

ඉන්දියාවත් සමග "සංවර්ධනය" වන කෘෂිකාර්මික නිෂ්පාදන රටවල් නියෝජනය කරමින් ඊනියා 20 කන්ඩායමට නායකත්වය දුන් බ්‍රසීලය මුලදීම වෙලඳ සම්මුතිය ගැන වොෂින්ටනය සමග ගැටුමකට එලඹී තිබුනි. සාකච්ඡාව මූලාරම්භයේදී කෘෂිකර්මාන්තයට සැලකිය යුතු තරමේ සහනාධාර ලබාදීමේ එ.ජ. සහ යු.ස. තර්කයන් නාසි ප්‍රචාරනයට සමාන කරමින් බ්‍රසීල විදේශ ඇමති සෙල්සෝ ඇමෝරිම් කෙටි සෝෂාවක් ඇති කලේය. "ඔබ බොරුවක් නැවත නැවත බොහෝ වතාවක් පවසනවානම් එය සත්‍යයක් බවට පත්වෙනවා යැයි ගොබෙල්ස් ප්‍රකාශ කරන්නට යෙදුනා." එ.ජ.-යු.ස. තර්කවල රැවටීමේ ස්වභාවය ගැන ඇමෝරිම් පැවසීය.

කෙසේවුවද රටෙහි ජීවඉන්ධන (biofuel) අපනයන අංශයේ මහා පරිමාන සංවර්ධනය සඳහා බ්‍රසීල ආන්ඩුවේ සහයෝගයද රටතුල ක්‍රියාත්මක වන ප්‍රධාන කෘෂිව්‍යාපාරික ආයතනවල අවශ්‍යතාද ප්‍රතිබිම්බනය රමින් අවසානයේදී බ්‍රසීලය සම්මුතියට බැකිම දුන්නේය.

වරදෙහි වැඩි ප්‍රමානයක් වොෂින්ටනය මත පටවන්නට යු.ස. යේ වෙලඳ කොමසාරිස් පීටර්

මැන්ඩෙල්සන්ද උත්සාහ කලේය. "එ.ජ. ඉතිහාසයේ වඩාත්ම ප්‍රතිගාමී ගොවිපල පනත් වලින් එකක් ලෙසට" ඔහු විස්තර කරන එ.ජ. කොන්ග්‍රසය මගින් මෑතකදී සම්මත කල පස් අවුරුදු කෘෂිකාර්මික සහනාධාර වැඩසටහන මගින් කෘෂිකර්මාන්තය මත පාර්ශ්වික අවහිරයක් නිර්මානය වූ බව ඔහු පැවසීය.

රොයිටර් පුවත් ඒජන්සිය සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී දුප්පත් රටවල වෙලඳපොල විවෘතකිරීමත් පොහොසත් රටවල සහනාධාර කපාහැරීමත් අතරේ ගනුදෙනුවකට. "ඩොලරයක් වෙනුවට ඩොලරයක්" ස්ථිර කෙරෙන වොෂින්ටනයේ ප්‍රවේශය මැන්ඩෙල්සන් විවේචනය කලේ විශේෂයෙන්ම කෘෂිකර්මය ආශ්‍රිතව ඊනියා සංවර්ධනය වන රටවල්වල සංවර්ධනය ප්‍රචලිත කිරීමේ අරමුන එහි බාහිර ආටෝපය ලෙස ඩෝහා වටය මූලිකවම දියත් කරන විටදී පැවතීම නිසාය.

බදාදා තම බ්ලොග් කොටස (BLOG) ලියමින් මැන්ඩෙල්සන් එ.ජ. අස්ථානයට වෙනත් සියුම් ප්‍රහාරයක් එල්ල කලේය. "එවැනි මැරතන් තරගයක අවසන් හැතැප්මේදී පරාජයට මුහුන පෑමට සිදුවීම අතිශයින් නරක දෙයකැ"යි ඔහු ලීවේය. "මේසය අනෙක් පැත්තේ සිටිනා සමහරු ජයග්‍රහනය වෙනුවෙන් වැඩකරනවා වෙනුවට. ඇත්තටම පරාජය සඳහා සූදානම් වන බවට තේරුම් යෑම වඩා නරකය."

සාකච්ඡා මේසයෙන් පැන දුවන්නට ව්‍යාජ හේතුවක් ලෙසට ඉන්දියානු සහ චීන ආස්ථානය. එ.ජ. දූත මන්ඩලය ආශීර්වාදයක් කරගත් බව බොහෝ දෙනාට දැනුනි. මැතිවරන වසරකදී දරුනු ලෙස කපා හරින කෘෂිකාර්මික සහනාධාර ගැන අපේක්ෂාවන් සමග ගොවීන් හා ගැටුමකට යාමට ධවල මන්දිරය කිසි ලෙසකින් උත්සුකතා ඇතිකර නොගනී. වැඩිදුරටත් ද්විපාර්ශ්වීය නිදහස් වෙලඳ සම්මුති ඇති කර ගැනීමට බුෂ් පරිපාලනය තම උත්සාහයන් වැඩි වැඩියෙන් යොමු කරමින් තිබේ. කොලම්බියාව. පැනමාව. සහ දකුනු කොරියාව සමග එළඹීමට නියමිත ගිවිසුම් කොන්ග්‍රසයේ හිරව ඇති අතර මෙම ක්‍රියාවලිය මැතිවරන කැලැන්ඩරය නිසා නැවතීමට භාජනය වී ඇත.

එකඟතාවයකට එළඹීමට අවශ්‍ය සහන සලසන්නට කිසිලෙසකින් හෝ එකතුවන්නේ යු.ස. නොවේ. මැන්ඩෙල්සන් විසින් ඉදිරිපත් කල කේවල් කිරීමේ අස්ථානය වැරදි බවට ප්‍රංශ ජනාධිපති නිකලස් සාර්කෝසි විසින් දොස් නැගූ අතර විශේෂිතවම ප්‍රංශයට කෘෂිකාර්මික සහනාධාර කැපීම සියුම් දේශපාලන කාරනාවකි.

මෙම සාකච්ඡා බිඳවැටීම දැනටමත් දෙදරා ඇති ලෝක ධනවාදී ආර්ථිකයට තවත් බාධාවක් ලෙසට පුලුල්ව ප්‍රකාශයට පත්කෙරේ. ගිවිසුමේ එම කොටසින් ප්‍රධාන කාර්මික රටවලට නව වාර්ෂික ලාභ ලෙස ඩොලර් බිලියන 110 ක්ද ඊනියා සංවර්ධනය වන හා නැගීඑන රටවලට එමෙන් දෙගුනයක් ද ලැබන බවට ලෝ.වෙ.ස. විශ්ලේෂකයෝ ගනන් බලති.

"භූගෝලීය ආර්ථිකයේ විශ්වාසවන්තභාවයට මෙය මරු පහරක් වෙනවා" යැයි යුරෝපීය කොමිසමේ ප්‍රකාශකයෙක් වන පීටර් පවර් පැවසුවේය. "අපට ඉතාමත්ම අවශ්‍ය නව විශ්වාසවන්ත බවේ ප්‍රයත්නය දැන් සිදුනොවනු ඇත."

ජර්මනියේ දිනපතා ව්‍යාපාරික පුවත්පත වන හැන්ඩල්බ්ලාට් මෙසේ අනතුරු ඇඟවීය. "දිගු කාලීනව ගත් කල ජිනීවාහි අන්ත පරාජය අතිවිශාල වැදගත් යමක කඩාවැටීමක් සටහන් කරයි. මේ දක්වා පැවති භූගෝලීයව පිලිගත් රාමුව. තනි තනි රාජ්‍ය ලෙසට ඇති කරගන්නා එකඟත්වයන් මතින් විස්ථාපනය කෙරෙන නිසා වෙලදාම පාලනය කරන නීති වඩා ගුප්ත වනු ඇත. ගැටලු සහගත තත්වයන්හිදී ඒවා සමනය කරන්නෙක් ලෙසට ලෝ.වෙ.ස.යේ බලපෑම නැතිවී යනු ඇත. ව්‍යාපාර වලට මෙහි මිල ක්‍රම ක්‍රමයෙන් තේරුම් යනු ඇති නමුදු එය ඉහල අගයක් ගනු ඇත. අපනයනකරුවන්ට වහාම අවශ්‍ය වන විශ්වාස කටයුතු බව වෙලඳ ක්‍රමයට නැතිවී යයිත."

ලෝ.වෙ.ස. සාකච්ඡා බිඳවැටීම "ලෝකයේ බල සම්බන්ධතාවල වෙනසක" ගම්‍යයක් වන බව ජර්මානු පුවත්පත පිලිගත්තේය. "එ.ජ. ට සහ යු.ස. ට තමන් අතරේ ලෝක වෙලඳ එකඟතාවයන්හි හඩ සකස් කරන්නට සහ පිලියෙලකරන්නට හැකි වූ කාලය තවදුරටත් එසේ නොපවතී. චීනය සහ ඉන්දියාව තදබල අස්ථානයක් ගත්හ. තමන්ගේ අවශ්‍යතා සඳහා ඔවුහු සටන් වදින අතර තමන්ට ගැලපෙන විට පමනක් නිදහස් වෙලඳමට සහයෝගය දෙති. පැරනි කාර්මික රටවල් මෙම කටුක සත්‍යය සෙමින් අවබෝධ කරගනු ඇත. ජිනීවා පූර්වානුභවයක් පමනක් විය."

බදාදා වොෂින්ටන් පෝස්ට් පුවත්පත "ඩෝහාහි මරනය" නමින් අඳුරු සහගත කතුවැකියක් ප්‍රකාශයට පත් කලේය. "මෑතකාලීන අප්‍රසන්න ආර්ථික ප්‍රවෘත්ති හැලි වලට ජිනීවා සිට මෙම අසතුටුදායක ලුහුඬු ප්‍රකාශය එක්වෙයි. ඩෝහා වටය නමින් හැඳින්වුන භූගෝලීය වෙලඳ සාකච්ඡා ඊයේ එකඟතාවයකින් තොරව බිඳවැටුනි." යනුවෙන් කතුවැකිය පටන්ගෙන ඇත. "පෙර දැකිය හැකි අනාගතයක් තුල එවන් ගිවිසුමක් සඳහා තමන් සූදානම් නැති බව" ලෝ.වෙ.ස.

යේ සාමාජික රටවල් ඔප්පුකල බව එය සඳහන් කලේය. "මෙම ප්‍රතිපලය ලෝ.වෙ.ස. අනාගත අදාලත්වය ගැන දිගු සෙවනැල්ලක් වාත්තු කරන අතර ප්‍රාදේශීයව හෝ කොටස්කාරී කන්ඩායම්වල තරගකාරීත්වයකට භූගෝලීය වෙලඳම බෙදීයාමේ හැකියාව වැඩිකරයි."

ඩෝහා වටයේ බිඳවැටීම සහ ලෝ.වෙ.ස. යේ විභවය දුර්වල වීම දෙවන ලෝක යුද්ධය අවසානයේ සිට වෙලඳ සම්බන්ධතා ගොඩනැගී ඇති බහුපාර්ශ්වියවාදයේ කඩාවැටීමක් දක්වා ගෙනයෑමට හැකිබව ගැන එ.ජ. සහ යු.ස. දෙකෙහිම පාලක කවයන්හි මුල්බැසගත් සැලකිල්ල මෙම ප්‍රකාශන පිටුපස පවතී.

බියජනක කරුන වන්නේ එදිරිවාදී වෙලඳ කන්ඩායම් ගනනාවක සහ ආරක්ෂනවාදයේ වැඩීම ඉස්මතු වී 1930 ගනන්වල මහා අවපාතය කාලයේදී ලෝක ආර්ථිකය ග්‍රහනය කරගත් අර්බුදයේ ප්‍රධාන ගති ලක්ෂන නැවත ප්‍රතිනිර්මානය කරමින් විශාල රැකියා විරහිතභාවයකට හා ලෝක යුද්ධයකට පාර කැපීමය.

© www.wsws.org